මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2213096 | සහකාර ලේකම්<br>உதவி செயலாளர்<br>Asst. Secretary | 081-5631321 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213082 |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CPC/PSC/15-18/ TO/ A.T.R.-2023 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023-03-07 |

ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, සභා ලේකම්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සියළුම ආයතන ප්‍රධානීන් වෙත,

<u>මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි/ සංවර්ධන නිලධාරි/ තාක්ෂණ සේවා නිලධාරි සේවයේ නිලධාරීන් සඳහා වාර්ෂික ස්ථාන මාරු - 2023</u>

2023 වසරේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ **කළමනාකරණ සේවා නිලධාරි, සංවර්ධන නිලධාරි** සහ **තාක්ෂණ සේවා නිලධාරි** සේවාවන්ට අදාළ වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධව අවසන් ස්ථාන මාරු නියෝග අපගේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇති අතර, අදාළ ලේඛන එමඟින් <u>බාගත කර ගන්නා</u> ලෙස මෙයින් දන්වමි.

02. ඒ අනුව, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත නිකුත් කළ මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක : GCP/02/ස්ථානමාරු/2023 හා 2023.02.28 දිනැති ලිපියේ සඳහන් නියෝගය පරිදි, මැතිවරණ කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක EC/SO/LAE/2023/4C(ii) හා 2023.02.27 දිනැති ලිපියෙන් ලද එකඟතාවය සහ ගරු කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව **මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි, සංවර්ධන නිලධාරි සේවයේ සහ තාක්ෂණ සේවා නිලධාරි සේවයේ නිලධාරීන්ගේ 2023 වාර්ෂික ස්ථාන මාරු නියෝග <u>2023.03.20</u> දිනට නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකිවන පරිදි ක්‍රියාත්මක කළ යුතු බව කාරුණිකව දන්වමි.**

03. තවද පහත කරුණු කෙරෙහි **ඔබගේ විශේෂ අවධානය** යොමු කර,

I. මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරි සේවයේ, කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සහ තාක්ෂණ සේවා නිලධාරි සේවයේ ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාණවත් අනුප්‍රාප්තිකයන් ලබාදී නොමැති නම්, ඉදිරි නව බඳවා ගැනීමකදී හා අන්තර් පළාත් ස්ථාන මාරුවීම් මඟින් ලබාදීමට නියමිත නිලධාරීන් අනුප්‍රාප්තිකයන් ලෙස සළකා ස්ථාන මාරු නියෝග ලද නිලධාරීන් මුදාහැරීමට කටයුතු කරන ලෙසත්,

II. සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරු නියෝග දීර්ඝ කර ඇති නිලධාරීන් සඳහා සුදුසු නිලධාරීන් කඩිනමින් පුහුණු කර නියමිත දිනයේදී මුදාහැරීමට කටයුතු කරන ලෙසත්,

III. 2023 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලේඛණයන් හි නම් සඳහන් නොවන, 2021 සහ 2022 වර්ෂයන් හි ස්ථාන මාරු නියෝග ලබා මේ දක්වා මුදා හැර නොමැති නිලධාරීන් සිටින්නේ නම්, එම නිලධාරීන්ද වහාම නව සේවා ස්ථාන වෙත මුදා හරින මෙන් කාරුණිකව දන්වමි.

04. එම වාර්ෂික ස්ථාන මාරු මාර්ගගත ක්‍රමයට **(Online)** තොරතුරු කැඳවීමේදී සම්බන්ධීකරණය සඳහා ඔබ විසින් පත් කරන ලද විෂය භාර නිලධරයා විසින්, **2023** වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව ඔබ ආයතන වෙත සේවයට වාර්තා කර ඇති නිලධාරීන්ගේ තොරතුරු පහත සඳහන් උපදෙස් අනුගමනය කර සම්පූර්ණ කළ යුතුවේ .

අ.පිට බලන්න

I. මුලින්ම ඔබගේ ආයතනයේ gmail නිල විද්‍යුත් තැපැල වෙත පිවිසෙන්න.

II. වාර්ෂික ස්ථාන මාරු සඳහා පමණක් භාවිත අපගේ විද්‍යුත් තැපැල් ලිපිනය trans.psc.cp.gov@gmail.com මගින් ඔබ ආයතනයේ විද්‍යුත් තැපැල වෙත එවූ පහත සඳහන් **google spreadsheet** වෙත පිවිසෙන්න.

- 2023 වාර්ෂික ස්ථාන මාරු - මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරින් (MSO) සේවයට වාර්තා කිරීම පිළිබඳ තොරතුරු ලේඛනය
- 2023 වාර්ෂික ස්ථාන මාරු - මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරින් (DO) සේවයට වාර්තා කිරීම පිළිබඳ තොරතුරු ලේඛනය
- 2023 වාර්ෂික ස්ථාන මාරු - මධ්‍යම පළාත් තාක්ෂණ සේවා නිලධාරින් (TO) සේවයට වාර්තා කිරීම පිළිබඳ තොරතුරු ලේඛනය

III. එහි තොරතුරු ඇතුළත් කිරිමේදී Unicode (Iskoola potha) අකුරු වර්ගය භාවිත කළ යුතුය.

IV. ඉහත google spreadsheet හි ඇති සේවයට වාර්තා කිරීම පිළිබඳ තොරතුරු හි ඔබගේ ආයතනයට පමණක් අදාළ ස්ථානයක් වෙන් කර ඇති අතර එහි අවසන් තීරු (column) 2 හි පමණක් අදාළ තොරතුරු නිවැරදිව ඇතුළත් කරන්න.

05. එම විස්තර ඇතුළත් google spreadsheet හි ඔබ ආයතනයට අදාළ කොටසෙහි වාර්තාව පමණක් මුද්‍රණය කර (Print out) ආයතන ප්‍රධානියාගේ අත්සන සහිතව **2023.04.20 ට පෙර තැපැල මගින් මෙම කොමිෂන් සභාව වෙත එවිය යුතුය.**

කොමිෂන් සභාවේ නියමය පරිදි,

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත.

පිටපත :

| | |
|---|---|
| 1. විගණකාධිපති | - අ.ක.ස. |
| 2. සම්බන්ධීකරණය සඳහා පත් කළ විෂය භාර නිලධරයන් වෙත | - ඉහත උපදෙස් අනුගමනය කර තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා |